සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ...................................................................................... විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

◆ **පහත සඳහන් එක් එක් වාක්‍යයේ ඉරිඇඳි කොටසේ අර්ථය ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.**

(01) දුම්රියපළෙහි සිටි මගීහු <u>වදෙන් පොරෙන්</u> උඩරට මැණිකේ දුම්රියට නැග ගත්හ.
 (1) අකමැත්තෙන් (2) ඉතා අමාරුවෙන්
 (3) හදිසියෙන් (4) ඉතා උනන්දුවෙන්

(02) තාත්තා හෙට යාමට සූදානම් වන ගමන ගැන මම <u>ඉන්තේරුවෙන්</u> දැනගත්තෙමි.
 (1) වැරදි ලෙස (2) අනුමාන වශයෙන්
 (3) සම්පූර්ණයෙන් (4) යාන්තමින්

◆ **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

(03) පැරණි ශාස්ත්‍රීය ග්‍රන්ථ .............................. කිරීමෙන් වටිනා තොරතුරු දැනගත හැකි ය.
 (1) පරිශීලනය (2) පරිවර්තනය
 (3) ප්‍රතිනිර්මාණය (4) සංගෘහිත

(04) කඳුකර ප්‍රදේශවල නායයෑම් වළක්වා ගැනීමට පස ........................................... කළ යුතු ය.
 (1) සංවේදනය (2) සංරක්ෂණය
 (3) වියෝජනය (4) සංහරණය

(05) සියලු ම පදවල අක්ෂර වින්‍යාසය **නිවැරදි** ව යෙදී ඇති පිළිතුර තෝරන්න.
 (1) ප්‍රදර්ශණය , පෝශණය , ගවේශණය , ශ්‍රවනය
 (2) නිරීක්ෂණය , විශිෂ්ට , දර්ශනය , නිර්මාණය
 (3) විශේස , අවදානය , ප්‍රතිපල , අළුත්
 (4) රමනීය , පිළියෙළ , කුශලතාව , භාවපූර්ණ

(06) මුලින් දී ඇති පදයට සමානාර්ථ පද පමණක් ඇති පිළිතුර තෝරන්න.
 (1) සුදන - දුදන , දුර්ජන , කුදන , කුපුරිස්
 (2) සඳ - චන්ද්‍රයා , සිසි , තරිඳු , උළිඳු
 (3) සර - විල , ශබ්දය , ස්වරය , රස
 (4) ගත - මුහුණ , සත , පාදය , මාර්ගය

Department of Education – Western Province

(07) අසම්භාව්‍ය ක්‍රියා පමණක් ඇති පිළිතුර තෝරන්න.

(1) පැමිණ, බලා (2) දුවමින්, ගයමින්

(3) ගියහොත්, වයද්දී (4) සිනාසෙයි , ලියවයි

(08) නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

(1) ලේනා අඹ කමින් මා දෙස බැලුවේ ය.

(2) බුද්ධිමත් ශිෂ්‍යයෝ විනීතව හැසිරෙති.

(3) ගායක ගායිකාවෝ ගී ගැයුවෝ ය.

(4) උදෑසන කුරුල්ලෝ නාද කරති.

(09) තාලුජ අක්ෂරයක් හා මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත් වරණය වන්නේ,

(1) සමීක්ෂණය (2) සංශෝධනය

(3) විශ්වාසය (4) අධිෂ්ඨානය

(10) උපසර්ග පද ගණයට අයත් **නොවන** පද ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) පිළිතුරු , දුබල , ප්‍රතිකාර්යය , පසිඳු

(2) හිරිහැර , නිලුපුල් , ප්‍රියතම , සිරස

(3) අවපස , සුසිනිඳු , විමල , අභිමානය

(4) අනුවාදය , නිරෝගී , අතිවිශාල , පිළිසරණ

(11) භාවාර්ථයේ නිපාත ඇතුළත් පිළිතුර වන්නේ,

(1) සහ, සමඟ, හා , හෝ

(2) සිට , තෙක්, දක්වා, තුරු

(3) අනේ, අහෝ, අයියෝ, ඕහෝ

(4) නිසා, සඳහා , උදෙසා, පිණිස

(12) යුගල පද ගණයට අයත් **නොවන** පද පේළිය තෝරන්න.

(1) අබල දුබල, ශුද්ධ පවිත්‍ර, වතු පිටි, ගේ දොර

(2) නහින දෙහින , මිළ මුදල් , අය වැය , එහා මෙහා

(3) අකාමකා , කසු කුසු, යාන වාහන , ගමන් බිමන්

(4) අවවාද , සිරිසර, පරණ හරණ , දීන සීන

(13) පහත දී ඇති A, B, C, D වාක්‍ය අතුරින් නිත්‍ය බහුවචන පද යෙදී ඇති වාක්‍ය යුගලය වන්නේ,

(A) ඇතමෙක් ගමන යාමට කැමති වූහ.

(B) අමුත්තෙක් උත්සවය පැමිණියේ ය.

(C) දියණියෝ මල් පූජා කළෝ ය.

(D) සමහරෙක් රටේ සංවර්ධනය උදෙසා වැඩ කරති.

(1) A හා C ය. (2) B හා D ය.

(3) A හා D ය. (4) B හා C ය.

(14) පුස්කොළ පොත්වල වාක්‍ය අවසානයේ යෙදූ විරාම ලක්ෂණය

(1) දෙතිත නම් වේ. (2) කුණ්ඩලිය නම් වේ.

(3) ඇල ඉර නම් වේ. (4) කාකපාදය නම් වේ.

Department of Education – Western Province

(15) මුලින් දී ඇති අදහස ඇතුළත් පිරුළ තෝරන්න.

සුදුසු දේ තිබිය දී නුසුදුසු දේ භාවිත කිරීම

(1) ආතාට අටුකොස් දුන්නා වගෙයි.
(2) වක්කඩේ හකුරු හැංගුවා වගෙයි.
(3) ආඳා යවා තබා වල්පත ගත්තා සේ
(4) තරාදිය තිබිය දී අතින් කිරන්නා සේ

(16) කුඹුරක මංගල බීජ රෝපණය හැඳින්වෙන්නේ,

(1) ඉස්නන් බැඳීම නමිනි.
(2) නෙළුම් ඇල්ලීම නමිනි.
(3) පුරවැඩුම නමිනි.
(4) පුරන් කෙටීම නමිනි.

(17) පොහොති කිරීම, අනිසය, වසත්තු කිරීම යන ව්‍යවහාර වල නිවැරදි අර්ථය පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

(1) වතාවත් කිරීම, අප්‍රමාණ, කනගාටුවීම
(2) සංග්‍රහ කිරීම, නොවටිනා, කිසිවක් හෙළි නොකිරීම
(3) පොහොය කර්ම, අනුමාන, උදවුකිරීම
(4) පිරිසිදු කිරීම, වියවුල, බොරුකීම

(18) 'මොහු නෙත තිලුපුලේ
වුවනත සුපුන් සසලේ'

ඉහත දැක්වෙන පද්‍ය කොටසේ ඇති අලංකාර විශේෂය වන්නේ,

(1) උපමාවකි. (2) අනුප්‍රාසයකි.
(3) උපමේයකි. (4) රූපකයකි.

- **පහත සඳහන් වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(19) (1) ගායකයෝ ගී ගයද්දී අපි අසා සිටියෙමු.
(2) තෙරණුවෝ ධර්මය දේශනා කරති.
(3) සිඟිති දැරිය මා සමඟ සිනාසුණේ ය.
(4) සභාවෙන් කෙනෙක් කතාවක් කරන ලදී.

(20) (1) මැණියන් දෑ ආහාර පිසුවා ය.
(2) අයෙක් අන්‍යයන්ට උපකාර කරති.
(3) හිරු නැගෙද්දී පියුම්හු විකසිත වෙයි.
(4) අරිසෙන් අහුබුදු ගුරීහු රසවත් පද්‍ය රචනා කළේ ය.

(ලකුණු 2 × 20 = 40)

Department of Education – Western Province

## II කොටස

- **මෙම කොටසේ 01 හා 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

(01) පන්ති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ නාට්‍ය පිටපත් නිර්මාණය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(1) ඔබ කණ්ඩායම සකස් කළ නාට්‍ය පිටපතේ මාතෘකාව කුමක් ද? (ලකුණු 02)

(2) ඔබේ නාට්‍ය පිටපත රසවත් වීමට යෙදූ උපක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(3) ඔබ සකස් කළ නාට්‍ය පිටපතේ ඇතුළත් චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(4) ඔබ කණ්ඩායම ලියූ නාට්‍ය පිටපතෙන් ලබාදෙන උපදේශය කුමක් ද? (ලකුණු 04)

(5) නාට්‍ය පිටපත සකස් කිරීමේ දී මතු වූ ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(6) නාට්‍ය පිටපත සකස් කිරීමෙන් ඔබට ලැබුණු කුසලතා **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** යටතේ වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

(1) ජනකවිය අපේ සංස්කෘතියේ කැඩපත යි.

(2) රූපවාහිනිය අධ්‍යාපනයට උදව් කර ගනිමු.

(3) සමගිය සමාජ දියුණුව ඇති කරයි.

(4) ළමා පරපුර ආරක්ෂා කර ගනිමු.

(5) ඩෙංගු උවදුර පිටුදකිමු. (ලකුණු 14)

(03) සඳතැන්න මහා විද්‍යාලයීය 'සිසුප්‍රභා' වාර්ෂික විවිධ ප්‍රසංගය විදුහල්පතිතුමා හා ගුරු මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට තීරණය කර ඇත.

දිනය - 2017-12-01

ආරම්භය - පෙ.ව. 9.00 ට

ප්‍රධාන ආරාධිත අමුත්තන් - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා හා ප්‍රාදේශීය ලේකම්තුමා

මෙම අවස්ථාවට සහභාගි වන ලෙස දෙමාපියන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 10)

(04) පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(අ) ''තමන්ගෙ බත තමන් උයා පිහාගෙන කෑම මදිකමක්වත් අවනම්බුවක්වත් නොවෙයි''

(1) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(2) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටාගත් ග්‍රන්ථය කුමක් ද?

(ආ) ''දරුවනි, දෙකින් එක බේරෙන්නේ අද හෙට කරන යුද්ධයෙන් තමා''

(1) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(2) එම පාඩම උපුටාගත් ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(ඇ) ''ආයුබෝවන්! පොඩි දරුවනි, ඉතින් මොකද මේ පැත්තේ ?''

(1) මෙම ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය නිර්මාණයේ රචකයා කවු ද?

(2) 'පොඩි දරුවනි' යනුවෙන් ඇමතුවේ කාහට ද?

Department of Education – Western Province

(ඇ) ''හීන පිට හීන දැක්කත් මට නම් ඒක කරන්න බෑ''

(1) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?

(2) ඉහත ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ ලේඛකයා කවුරුන් ද?

(ඉ) 'අපි හැම වෙළෙඳාම් නවාම් ගොවිතැන් බත් කෙරෙමින් දුග්ගෙන වසම්හ'

(1) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටාගත් මුල් කෘතිය කුමක් ද?

(2) එය ලියූ ලේඛකයා නම් කරන්න. (ලකුණු 2 × 5 = 10)

(05) 'වනපෙත දූවෙන විට වැද මළ හිරුගෙ රත

ගනඳුර වසන විට ආලෝකයෙහි නෙත

..............................................................................

..............................................................................

(1) ඉහත දැක්වෙන පද්‍යයේ ඉතිරි පද්‍ය පාද දෙක සම්පූර්ණ කරන්න.

(2) මෙම පද්‍යය ඇතුළත් පද්‍ය පන්තියෙන් වර්ණනා කරන්නේ කුමන ස්ථානයක් පිළිබඳව ද?

(3) පද්‍ය පන්තිය ලියූ රචකයා නම් කරන්න.

(4) මෙම රචකයා ලියූ වෙනත් පද්‍ය නිර්මාණයක් නම් කරන්න.

(5) මෙහි ඇති 'ආලෝකයෙහි නෙත' යන කොටසින් අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

(06) සතොස් කරන වීණා නද ඇසුමට

නොගොස් සිටින පිළිබර ගණ ගොදුරට

..............................................................................

..............................................................................

(1) ඉහත සඳහන් කවියේ ඉතිරි පද්‍ය පාද දෙක සම්පූර්ණ කරන්න.

(2) මෙම පද්‍ය ඇතුළත් පද්‍ය නිර්මාණය කුමක් ද?

(3) පද්‍ය නිර්මාණය අයත් සාහිත්‍ය යුගය නම් කරන්න.

(4) මෙම පද්‍ය නිර්මාණයේ කතුවරයා කවුරුන් ද?

(5) පද්‍ය නිර්මාණය රචනා කළ යුගයට අයත් සන්දේශ කාව්‍යයක් නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

(07) පහත දැක්වෙන ඡේදය කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මහින්දාගමනය නිසා උරුම වූ වාරි සංස්කෘතිය නිසා ලාංකිකයා තුළ යහපත් සංස්කෘතිකාංග ද ආචාර ධර්ම ද ගොඩ නැගුණි. ජීවිතයේ කුඩු මහත් වූ සියලු ම කටයුතු සඳහා ජලය ලබාදෙන වැව දේවත්වයෙන් සැලකිණි. එබැවින් වැවට අධිපති දෙවියන් වෙනුවෙන් ''නිහර වී පූජාව'' සිදු කිරීම අතීතයේ සිට පැවතුණි. එමෙන් ම සශ්‍රීකත්වය පතා මුට්ටි නැමීමේ මංගල්‍යය නමින් ප්‍රධාන අභිචාරාත්මක පූජා කර්මයක් පැවැත්වේ. මෙම කාර්යය සමස්ත වැව්

Department of Education – Western Province

බැඳි රාජ්‍යයට ම පොදු ය. අයියනායක දෙවියන් ප්‍රධාන කොට පවත්වනු ලබන මෙම අභිචාර විධිය වටා වටිනා ගැමි සංස්කෘතික ලක්‍ෂණ දැකගත හැකි ය. මුට්ටි නැවීමේ චාරිත්‍රය සඳහා තෝරාගනු ලබන්නේ වැව් බැම්මේ දිය කෝල්බඩ පිහිටි ජලයට නැමුණු පූජනීය ගසකි. ගසේ අතුවල අගිසි කොටස එක මට්ටමකට කපා අඩියක පමණ කොටසක පොත්ත ඉවත් කර ඒ මත ගෞරවාදර සහිත අලුත් මුට්ටි නැවීම සිදුකෙරේ. නානුමුරය හා දිය කැපීම යන සංස්කෘතික උත්සව ද ජලනිධි මුල්කොට ගෙන සකස් වී ඇත.

(1) අතීතයේ ජනතාව වැව දේවත්වයෙන් සැලකීමට හේතුව සඳහන් කරන්න.

(2) වැවට අධිපති දෙවියන් වෙනුවෙන් කළ පූජා විධිය කුමක් ද?

(3) සශ්‍රීකත්වය අපේක්‍ෂාවෙන් සිදු කරනු ලබන පූජා විධිය නම් කරන්න.

(4) එම පූජා විධිය සිදු කළ ආකාරය කෙටියෙන් ලියන්න.

(5) ජල නිධි මුල්කොට ගෙන පවත්වන සංස්කෘතික උත්සව දෙකක් නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

Department of Education – Western Province